**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2013**
---------------------------------------------------

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය ,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 37 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට(ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කමක් පාවිච්චි කිරීම සඳහා යෝග්‍ය තත්ත්වයට පත්වූ අවස්ථාවේ සිට වත්කමේ ප්‍රයෝජනවත් කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළයුතු වුවත්, කොමිෂන් සභාව විසින් වත්කමක් මිලදී ගත් වර්ෂය තුළදී ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී මිලට ගන්නා ලද රු.74,983,695 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) මගී ප්‍රවාහන සමාගම් සඳහා මිලදී ගන්නා ලද රු.671,846 ක් වටිනා ලීබඩු හා සවිකිරීම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. .

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අන්තර් පළාත් බස්රථවල සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී මිලදී ගන්නා ලද ජී.පී.එස් උපකරණ වෙනුවෙන් ගෙවිය යුතු රු.13,231,854 ක් ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්නුම් කර නොතිබුණි.

(ආ) වවුනියාව බස් නැවතුම්පළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව 2014 ජනවාරි 01 දින ගෙවන ලද රු.21,349,943 ක් වූ වැඩපූර්ව අත්තිකාරම් ඉදිරි වර්ෂයේ ගිණුම් ගතකිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ගනුදෙනුවක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් උපචිත පදනම මත ගිණුම් තැබීම් සිදුකළ ද සමාලෝචිත වර්ෂයට අදාළ ගෙවිය යුතු රු.364,479 ක වියදම ගිණුම් ගතකර නොතිබූ අතර ආයෝජන වෙනුවෙන් බැංකුව විසින් ලබාදුන් රු.315,999 ක පොළිය බැංකුව විසින් තහවුරු කර තිබියදීත් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන වටිනාකම රු.170,176,087 ක් වූ අතර ඒ මත ලැබුණු පොළිය නැවත ආයෝජනය කළ නමුත් ආයෝජනයක් ලෙස ලද පොළිය ගිණුම් ගත කිරීම වෙනුවට ලැබිය යුතු පොළී ගිණුමක ඇතුළත් කර තිබුණි. බැංකු තහවුරු කිරීම් අනුව ලද පොළිය රු.9,533,912 ක් වුවද ලැබිය යුතු පොළී ලෙස ගිණුම් ගතකර තිබූ ප්‍රමාණය රු.8,877,359 ක් විය.

**2.3. නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතුවල, කෙටි කාලීන තැන්පතු හා ඇමතුම් තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු.16,525,336 ක රු.170,176,087 ක් සහ රු.8,400,591 ක මුදලක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 9 වන වගන්තිය | (i) රාජකාරී සඳහා පිටරට යන නිලධාරියකුට පවුම් 75 කට සමාන උණුසුම් ඇඳුම් දීමනාව රුපියල් වලින් ගෙවිය යුතු වුවත් නිලධාරීන් 07 දෙනෙකු සඳහා අවස්ථා දෙකකදී ඇමරිකන් ඩොලර් 861 ක් ගෙවා තිබුණි. |
| | (ii) උණුසුම් ඇඳුම් දීමනාව ගෙවිය හැක්කේ සමශීතෝෂ්ණ දේශගුණයක් ඇති රටවල් සඳහා පමණක් වුවත් එවැනි දේශගුණයක් නොමැති සිංගප්පූරුවට යාම වෙනුවෙන් මෙම උණුසුම් ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(අ) | නිලධාරියෙකුට වරකට ලබාදිය හැකි අත්තිකාරම් මුදල රු.20,000 ක් වුවද රු.87,600 සිට රු.455,000 දක්වා අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | ආයතනයේ වාහන සඳහා දෛනික ධාවන සටහන් පවත්වාගෙන ගියද එම එක් එක් වාහනය සඳහා ලබාගත් ඉන්ධන, පාරිභෝජනය කරන ලද ඉන්ධන සහ ටැංකියේ ඉතිරි ඉන්ධන ප්‍රමාණය දැක්වෙන පරිදි ඉන්ධන තුලනය කිරීමත් සිදු නොකරන ලද අතර එම ධාවන සටහන්වල හා මාසික සාරාංශවල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 1647 | ආයතනය සතු සියළුම වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් වෙනස්කම් පිළිබඳ වාර්තා නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාව සතු සෑම වාහනයකටම අදාළව මාස 06 කට වරක් ඉන්ධන පරිභෝජනය සුදුසුකම් සහිත පුද්ගලයකු ලවා පරීක්ෂා කරවා ගෙන නොතිබුණි. |
| (ඉ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පෞද්ගලික පාවිච්චිය සඳහා වෙන්කර ඇති වාහන හැර අනෙකුත් සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක (IAI/2002/02) දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (උ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මිලදී ගනු ලබන වත්කම් ඉන්වොයිසියේ සඳහන් වටිනාකමට වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුණද වාර්ෂික ක්ෂයවීම්,අගය වැඩිවීම් හෝ අපහරණය කිරීම් වෙන් වෙන්ව ඇතුළත් කර නොතිබුණි. |
| (ඌ) | 2013 නොවැම්බර් 04 දිනැති අංක එෆ්පී/06/35/02/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | කොමිෂන් සභාවේ මාසික වැටුප රු.50,000 ඉක්මවූ නිලධාරියකුගෙන් උපයනවිට ගෙවීමේ බද්ද අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (එ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 2.11.1 (ඈ) වගන්තිය | මගී ආවරණ 25 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් වූ පළමු රැස්වීම ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයීමේ කමිටුව ඒකාබද්ධව පවත්වා නොතිබුණි. |
| | (ii) 4.2.3. වගන්තිය (ඇ) | ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් කාලසටහනක් පිළියෙල කර ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) 4.3.1 හා 4.3.2 වගන්ති | මගී ආවරණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. |
| | (iv) 6.2.2 වගන්තිය | දුරගමන් සේවා මගී ආවරන ඉදිකිරීම සම්බන්ධයෙන් ලංසු කැඳවීමේ අවම කාලසිමාව වූ දින 21 ක් ලංසුකරුවන් වෙත ලබා දී නොතිබුණි. |
| | (v) 8.9.1 වගන්තිය | කොමිෂන් සභාව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමට එළඹ නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.181,195,469 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,680,681 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.183,876,150 ක පිරිහීමක් පෙන්නුම් කර තිබූ අතර විශේෂ ව්‍යාපෘති, ආයතනික, නීති, පුවත්පත් දැන්වීම්, ක්ෂයවීම් හා වෙනත් වියදම් සියයට 29 සිට 69 දක්වා පරාසයක වැඩි වී තිබීම මෙයට හේතු වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර ආයතන 15 ක් විසින් කාලසටහන්, මගී සේවා අවසරපත්, බස් ගාස්තු ප්‍රතිශෝධනය, බස් නැවතුම්පළ පහසුකම්, බස් රථයක සේවකයින් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධව අධිකරණවල නඩු 15 ක් සභාවට එරෙහිව ගොනුකර තිබුණි.

(ආ) ආයතනය විසින් කාලසටහන්, බස් නැවතුම්පළ පැවරීම, මගී සේවා අවසරපත්, මගී සේවා අවසරපත් නොමැතිව ධාවනය කිරීම, ගැමිසැරිය, සිසුසැරිය, සහනාධාර ගෙවීම සම්බන්ධයෙන් ආයතනවලට එරෙහිව නඩු 10 ක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බස් ධාවකයින් බස් ධාවනය සඳහා යොමු නොවන අනාර්ථික ග්‍රාමීය මාර්ගවල බස් ධාවනයට පෙළඹවීම සඳහා ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ගැමිසැරිය සේවා ව්‍යාපෘතිය යටතේ පසුගිය වර්ෂය අවසන් වන විට බස් 21 ක් ධාවනය වෙමින් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී නව සේවාවන් 50 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද ආරම්භ කිරීමට හැකිවී තිබුණේ සේවාවන් 19 ක් පමණි. තවද වර්ෂය තුළදී නියමිත පරිදි සේවා නොසැපයීම නිසා පැවති සේවාවන් 09 ක බලපත්‍ර අවලංගු කර තිබූ අතර වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක වූ මුළු බස්රථ සංඛ්‍යාව 31 ක් වී තිබුණි. වාර්ෂිකව නව සේවාවන් ආරම්භ කළද ඉහත හේතුවෙන් ආයතනයේ ඉලක්ක කරා යාමට නොහැකිවී තිබුණි.

(ආ) රාත්‍රී කාලයේදී මෙන්ම හිමිදිරි උදෑසන බස් සේවාවන්හි පවතින හිඟකම නිසා මගී ජනතාවට විඳීමට සිදුවන අපහසුතා මඟහරවා ඔවුන් වෙත පොදු ප්‍රවාහන සේවාවක් ලබාදීමේ අරමුණෙන් ආරම්භ කරන ලද නිසිසැරිය බස් සේවාව සඳහා සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට බස්රථ 123 ක් යොදවා තිබූ අතර වර්ෂය තුළදී නව බස්සේවාවන් 75 ක් යෙදවීමට ඉලක්ක කර තිබුණද ආරම්භ කිරීමට හැකිවී තිබුණේ සේවාවන් 42 ක් පමණි. වර්ෂයේදී නියමිත පරිදි සේවාවන් සැපයීමට අපොහොසත්වීම නිසා සේවාවන් 31 අවලංගුවී තිබුණු අතර වර්ෂය අවසන් වන විට ධාවනය කිරීමට නියමිතව තිබූ මුළු බස්රථ ගණන 134 ක් වුවද, ධාවනය වෙමින් පැවතියේ බස්රථ 111 ක් පමණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීමට සැලසුම් කර තිබූ නුවරඑළිය, උඩුපුස්සැල්ලාව, හයිෆොරස්ට්, යාපනය, මුලතිව්, කිලිනොච්චි සහ මන්නාරම යන යෝජිත බස් නැවතුම්පළවල් 07 සඳහා ඉඩම් නිරවුල් කර ගැනීම, සැලසුම් ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම් කටයුතු නිමකර නොතිබීමෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. තවද නුවරඑළිය නවීකරණ කටයුතු 2014 වර්ෂයේදී නිමකිරීමටත්, උඩුපුස්සැල්ලාව සහ හයිෆොරස්ට් ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂයේදී නිමකිරීමටත් නැවත සැලසුම් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව දුරගමන් සේවා මගී ආවරණ 35 ක් ඉදිකිරීමට රු. මිලියන 10 ක මුදලක් වෙන්කර තිබුණද වර්ෂයේදී මගී ආවරණ 25 ක් පමණක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා 13 ක් පමණක් ඉදිකර ඒ සඳහා රු.2,883,240 ක මුදලක් වැයකර තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නුවරඑළියේ සිට කොළඹ හා වෙනත් ප්‍රදේශ දක්වා ධාවනය වන බස්රථ පිළිබඳ කරනු ලැබූ සමීක්ෂණයකට අනුව මාර්ග 19 ක් සඳහා බස්රථ 44 ක අවශ්‍යතාවයක් තිබුණද ඉන් බලපත්‍ර 10 ක් වෙනුවෙන් මිල ගණන් කැඳවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන මිල ගණන් කැඳවා තිබුණේ 05 ක් සඳහා පමණි. 2014 ඔක්තෝබර් 31 දින වන විට තවත් බලපත්‍ර 02 ක් පමණක් නිකුත් කර තිබුණි. බලපත්‍ර ලබාගැනීම සඳහා බස් ධාවකයින් ඉදිරිපත් නොවීම සහ ඉදිරිපත්වූ අයගෙන්ද සුදුසුකම් ලැබූ ඉල්ලුකරුවන් නොසිටීම හේතුවෙන් බලපත්‍ර දෙකක් පමණක් නිකුත් කිරීමට සිදුවී තිබූ බව සභාපතිවරයා විසින් ප්‍රකාශකර තිබුණි.

(ආ) සමීක්ෂණ දෙකකින් අනාවරණය කරගත් තොරතුරු අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත තවත් මාර්ග 06 ක් වෙනුවෙන් බලපත්‍ර 07 ක් නිකුත් කිරීම සඳහා ටෙන්ඩරය මගින් මිල ගණන් කැඳවා තිබූ අතර 2014 ඔක්තෝබර් අවසන් වන විට මගී සේවා බලපත්‍ර 04 ක් පමණක් නිකුත් කර තිබුණි . නියමිත මිළ ගණන් අනුව මාර්ග බලපත්‍ර ලබාගැනීම සඳහා බස් ධාවකයින් ඉදිරිපත් නොවීම හේතුවෙන් මාර්ග බලපත්‍ර හතරක් පමණක් නිකුත් කිරීමට සිදුවූ බව සභාපතිවරයා විසින් ප්‍රකාශකර තිබුණි.

(ඇ) කොළඹ - කුච්චවේලී මාර්ගය සඳහා මගී අවසරපත්‍ර දෙකක් සඳහා ලැබුණු මිල ගණන් අතුරින් වැඩිම මිල ඉදිරිපත් කරන ලද අයදුම්කරු එම බලපත්‍රය ලබාගැනීම ප්‍රතික්ෂේප කර තිබූ අතර දෙවන වැඩිම මිල ඉදිරිපත් කරන ලද අයදුම්කරුට ප්‍රතික්ෂේපිත අයදුම්කරුගේ මිලට බලපත්‍රය ලබා ගන්නා ලෙස කරන ලද යෝජනාවට එකඟ නොවීම නිසා එම බලපත්‍රය වැඩිම මිලට ඔහුටම ලබාදීමට උත්සාහ කිරීම හේතුවෙන් එය නිකුත් කිරීමට 2013 දෙසැම්බර් 26 දක්වා ප්‍රමාදවී තිබුණි. මගීසේවා බලපත්‍ර සඳහා ටෙන්ඩර් කැඳවීමේදී ලංසු ඇපකරයක් තබා ගත්තේනම් මෙවැනි ප්‍රතික්ෂේප කිරීම් වලදී ඇතිවන පාඩුව අවම කරවා ගත හැකි වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර , මෙසේ ප්‍රතික්ෂේප කරන පුද්ගලයින්ට නැවත බලපත්‍රයක් ලබාගත නොහැකි වන පරිදි ඔවුන්ගේ නම් අසාදු ලේඛනයටද ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ ප්‍රවාහන අපහසුතා ඇති පාසැල් ළමුන් සඳහා නොමිලේ පාපැදි බෙදාදීම සඳහා 2012 වර්ෂයේ අවසාන කාර්තුවේ මිලදී ගත් පාපැදි විවිධ අඩුපාඩුවලින් යුක්තව ලබාදී තිබූ අතර එම අඩුපාඩු සකස් කර දෙන ලෙස අදාල සැපයුම්කරු දැනුවත් කළද ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා තිබියදීත් 2013 වර්ෂය සඳහාද එම ආයතනයෙන් තවත් පාපැදි 2250 ක් මිලදී ගෙන තිබුණු අතර ඒවාද අඩුපාඩු සහිතව සපයා තිබුණි. මෙවැනි අඩුපාඩු

සහිත පාපැදි ආපසු සැපයුම්කරුවන් වෙත යොමුකිරීම වෙනුවට ඒ සඳහා ගෙවිය යුතු මුදලින් සියයට එකක ප්‍රමාණයක් අඩුකර මුදල් ගෙවා තිබුණි. තවද පෙර වර්ෂය තුළදී මිලට ගත් පාපැදිද ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළදී රු.28,750,150 ක් වටිනා පාපැදි 3050 ක් බෙදාදී තිබූ අතර එම පාපැදි භාරගත් බවට අදාළ සිසුන් අත්සන් කර නොතිබූ නිසා මෙම පාපැදි අදාළ ශිෂ්‍යයාට හෝ ශිෂ්‍යාවට භාර දී ඇති බවට තහවුරු කරගත නොහැකි විය.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ හා පිට පළාත්වල සිට උතුරු හා නැගෙනහිර ප්‍රදේශ දක්වා මගී සේවා බලපත්‍ර නිකුත් කිරීමට අංක 10/2374/445/077 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් ලබාගත් අනුමැතිය යටතේ 2012 මැයි 31 දිනෙන් පසුව බලපත්‍ර නිකුත් නොකිරීමට 2012 මාර්තු 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් තීරණය කර තිබුණි. එයට පටහැනිව 2012 ජුනි හා ජූලි මාසවලදී නිකුත් කර තිබූ මගී සේවා බලපත්‍ර දෙක පිළිබඳව මාගේ 2013 අප්‍රේල් 22 දිනැති අංක RT/B/NTC/13 දරන විගණන විමසුම මගින් පෙන්වාදී තිබියදීත් හා අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව විසින් කරන ලද පරීක්ෂණයේදී මින් ඉදිරියට එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව කටයුතු කරන බවට ලිඛිතව ප්‍රකාශකර තිබියදීත් සමාලෝචිත වර්ෂය තුළදී ද එම අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ තවත් බලපත්‍ර දෙකක් නිකුත්කර තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 09 දිනැති අංක 01/2013(i) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව එක් සේවකයකුට රු.12,500 බැගින් ප්‍රසාද දීමනාවක් ගෙවිය හැක්කේ ලාභ ලැබූ රාජ්‍ය සංස්ථා හා ඒ සමාන ආයතනවලට පමණක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව රු.181,195,469 ක සමස්ථ අලාභයක් ලබාගෙන තිබුණද සම්පූර්ණ ප්‍රසාද දීමනාවම ගෙවා තිබුණි. එසේ වුවද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් ජනිතවූ ලාභය රු.163,772,129 ක් බවත් එම ලාභය පදනම් කරගෙන ප්‍රසාද දීමනා ගෙවා ඇති බවත් සභාපතිවරයා විසින් පෙන්වාදී තිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

කොට්ටාව - මාතර අධිවේගී මාර්ගය සඳහා මගී සේවා අවසරපත් 27 ක් නිකුත් කිරීම සඳහා මිල ගණන් කැඳවීමේ දැන්වීම් පළකිරීම වෙනුවෙන් රු.295,215 ක මුදලක් වැය කර තිබුණද ඒ සඳහා කිසිදු ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයක් නිකුත් කර නොතිබුණු අතර මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමක්ද සිදුකර නොතිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තලවකැලේ බස්නැවතුම්පල අදියර දෙකකින් නිමකිරීමට සැළසුම් කර තිබුණු අතර මින් පළමු අදියර සඳහා වූ ඇස්තමේන්තුව රු. 31,389,340 ක් වූ අතර මෙම ඉදිකිරීම් කටයුතු තලවකැලේ නගර සභාව විසින් මෙහෙයවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු දක්නට ලැබුණි.

(i) මහල් තුනකින් සමන්විත මෙම ගොඩනැගිල්ල සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් රු.37,861,728.30 ක බදු රහිත ඇස්තමේන්තුවක් සකස් කර තිබුණ ද මෙය අදියර දෙකකින් නිම කිරීමට තීරණය කිරීම නිසා බිම් මහල පමණක් නැවත තලවාකැලේ නගර සභාව විසින් රු.31,389,340 කට ඇස්තමේන්තු කර තිබුණි එහෙත් විධිමත් පරිදි

අනුමත කරන ලද මෙම ඇස්තමේන්තු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්තුවේ කටයුතු කරගෙන යාමේදී යම් අමතර වැඩ කිරීමට සිදුවුවහොත් එම වැඩ ආරම්භ කිරීමට පෙර ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගතයුතු වුවත් 2014 ජනවාරි 31 දින සහතික කරන ලද රු.3,614,369 ක් වූ අමතර වැඩ සඳහා අනුමැතිය ලබාගෙන තිබුණේ එම කාර්ය නිමකිරීමෙන් පසුවය.

(iii) කොන්ත්‍රාත්තුව 2014 මාර්තු 31 දිනට පෙර නිම කළයුතු වුවත් 2014 අප්‍රේල් 23 දින දක්වා දීර්ඝකර තිබුණද 2014 සැප්තැම්බර් මස අවසන් වන විටත් කාර්ය නිමකර නොතිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ප්‍රමාදවූ එක් දිනක් සඳහා රු.7,149 බැගින් දින 159 ක් සඳහා රු.1,136,691 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(ආ) බැස්ටියන් මාවත බස් පර්යන්තයේ කාලසටහන් ප්‍රදර්ශනය කිරීම සඳහා රු.14,418,000 ක් වැයකර එල්ඊඩී තිරයක් සවිකර තිබූ අතර මෙම ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි.

(i) එල්ඊඩී තිරය මිලදීගෙන සවිකිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 ඡේද ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර ඒ අනුව කටයුතු නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට තීරණය කළ දින සිට මිල ගණන් කැඳවීම සඳහා වසරක පමණ කාලයක් ගතවී තිබුණි.

(ii) එල්ඊඩී තිරය සවිකිරීම සඳහා ඉදිරිපත්වූ මිල ගණන් අතුරින් අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතන හතරක්ම මෙම කාර්ය සම්බන්ධයෙන් පෙර පලපුරුද්දක් නොමැති ආයතන වූ බැවින් ඒ සඳහා පස්වන අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනය තෝරා ගැනීම හෝ සියළුම මිල ගණන් අවලංගුකර නැවත මිල ගණන් කැඳවිය හැකි වුවත්, එසේ නොකර අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය ලවා එම සැපයුම සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් (Presentation) කරවා ඔවුන් වෙත පවරාදී තිබුණි.

(iii) සැපයුම්කරු නියමිත කාලය තුළදී විධිමත් පරිදි කොමිෂන් සභාව සමඟ ගිවිසුම් අත්සන් කිරීමට නොපැමිණි බැවින් එම අවස්ථාවේදීම කොන්ත්‍රාත්තුව අවලංගු කර නැවත මිල ගණන් කැඳවිය හැකිව තිබුණද එසේ නොකර ඊට මාස 03 කට පසුව එම හේතුව පදනම් කරගෙන කොන්ත්‍රාත්තුව අවලංගු කර නැවත මිල ගණන් කැඳවීමකින් තොරව රාජ්‍ය සංස්ථාවක් වෙත රු.14,418,000ක මිලකට පවරාදී තිබුණි. මෙය පෙර ඉදිරිපත් කරන ලද අවම පස්වන මිලට වඩා රු.5,378,444 ක වැඩිවීමකි.

(iv) මුල් කොන්ත්‍රාත්කරු කාර්ය ඉටු නොකිරීම නිසා ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද කාර්ය සාධන සුරක්ෂණය නියමිත කාලය තුළ මුදල් බවට පරිවර්තනය කිරීමට කොමිෂන් සභාව අපොහොසත් වීම නිසා එහි කාලය ඉකුත්වීම හේතුවෙන් එය මුදල් කිරීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒ සඳහා නීති උපදෙස් ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

අනුමත කාර්ය මණ්ඩලය සහ සත්‍ය කාර්ය මණ්ඩලය හා සැසැඳීමේදී තනතුරු 61 ක් පුරප්පාඩු පැවති අතර මින් තනතුරු 19 ක්ම විධායක මට්ටමේ තනතුරු විය.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වලට ලබා දුන් කොමිෂන් සභාවේ සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැටුප් ප්‍රතිපූර්ණය කිරිමේ පදනම මත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට රියදුරු මහතුන් දෙදෙනෙක් මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට එක් රියදුරු මහතෙකුගෙන් මාස 04 ක් සඳහා රු. 106,542 ක් හා අනෙක් රියදුරු මහතාගෙන් එක් මාසයක් වෙනුවෙන් රු.12,229 ක් ලෙස එකතුව රු.118,771 ක මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ධාවනය වන බස් රථ පිළිබඳව පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයට ලැබෙන පැමිණිලි පරික්ෂා කිරීම සඳහා 2013 ජුනි 08 දිනැති අංක රහිත පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යවරයාගේ පුද්ගලික සහකාරගේ ලිපිය මගින් කරන ලද ඉල්ලීමකට අනුව කොමිෂන් සභාවට අයත් වෑන් රථයක් 2013 ජුනි 13 දින සිට 2013 ජූලි 15 දින දක්වා කොමිෂන් සභාවේ රියදුරෙක් සහිතව මුදාහැර තිබුණි. මෙම පරීක්ෂණ කටයුතු සඳහා යෙදවූයේ කවුරුන්ද යන්නත් කොපමණ පැමිණිලි සංඛ්‍යාවක් පරීක්ෂා කළේ ද යන්නත් ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්නත් පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවූ අතර අමාත්‍යාංශය වෙනුවෙන් නුවරඑළියේ රාජකාරි කළ කාලය තුළ ඉන්ධන හා ලිහිසිතෙල් වෙනුවෙන් රු. 40,410 ක මුදලක් හා සේවා ගාස්තු වෙනුවෙන් රු.15,960 ක මුදලක් නුවරඑළිය පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශ සම්බන්ධීකරණ කාර්යාලයට අනුබද්ධ ශ්‍රී ලංකා වැව්ලි සේවා සංගමයේ පරිපාලන ලේකම් වෙත ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දින ඉදිරිපත් කළද එය 2013 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී /POL./CIR /2013-3 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුව සකස්කර නොතිබීම නිසා 2014 මාර්තු 10 දින නැවත ලබාගෙන ඒ අනුව සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2014 අගෝස්තු 01 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා සංසන්දනය කිරීමේදී සියයට 20 සිට සියයට 1080 දක්වා පරාසයක් තුළ විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

**5.3 වාර්ෂික වාර්තාව සභාගත කිරීම**

1971 අංක 38 දරණ මුදල් පනතේ 12(3) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 ඔක්තෝබර් 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත වරින්වර වාර්තා කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම
(ආ) ප්‍රසම්පාදන කටයුතු
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) වාහන උපයෝජනය
(ඉ) අත්තිකාරම් ගෙවීම හා නිරවුල් කිරීම
(ඊ) උපචිත වියදම් වෙන්කිරීම